## යුගයක අත්දැකීම

# කපු කිරි කොල්ලෝ

පුංචි අප වැඩියෙන් ම විනෝද වූයේ සිංහල අවුරුදු කාලයට ය. කොයි දීපංකරේ සිටියත් අවුරුද්දට ගමට නො එන කෙනෙක් එකල නො වූ හ. පාන්දරින් ම දුව ගොස් අප අහුලා ගත් කපු එළියට එන්නේ අවුරුද්දට ය. වියළි කපු කලක් මත තබා පළා ගෙන කන්නට ගිය විට දෑතේ ම කපු කිරි තැවරෙයි. කපු කිරි නො තැවරුණු ගැමි දරුවකු අවුරුදු කාලයට නැති තරම් ය. කපු කිරි කොල්ලෝ යන ව්‍යවහාරය පටන් ගත්තේ මේ නිසා විය යුතු ය. කපු කිරි ගාගන්නේ තේරුමක් නැති පුංචි එවුන් ය. එම අපහාසයට ලක් වන්නේ ද නිසි තැකීමක් ලබන්නට නුසුදුසු පුංචි ළමයි ය.

වියළි කපු එළියට ගෙන කරන ක්‍රීඩා පටන් ගන්නේ අවුරුදු ලබන්නට කලින් ය. සරල ම ක්‍රීඩාව ඔත්තේ ඉරට්ටේ ඇල්ලීම ය. අපේ කපු ගොඩ වැඩි කර ගැනීමට කරන මෙයින් සමහර විට ගොඩ අඩු වනනට ද බැරි නැත. මිට මොළවා ගත් කපු ගණන හරියට කිව හොත් ඒ ටික ලැබෙයි. වැරදුණොත් ඒ ගණනට ම කපු අනෙකාට යයි. වළ කපු ගැසීම ඊට වඩා ජනප්‍රිය ක්‍රීඩාවකි. තරඟය ද දරුණු ය. ගෙදරක මිදුලේ කෙරෙන මෙම ක්‍රීඩාවට ගෙදර සිටින ලොකු කුඩා ගැහැනු සියලු දෙනාම සහභාගි වෙති. පිරිමින්ට සිටින්නේ කොල්ලෝ කුරුට්ටන් පමණි. සහභාගි වන්නන් සියලු දෙනාම වළකට කපු ඇටය බැගින් දැමීමෙන් පටන් ගන්නා මෙහිදී පෙත්ත වැටුණු වළේ කපු ඇට සියල්ලම එම ක්‍රීඩකයාට හිමි වෙයි. මැද වළට පෙත්ත දමා සියලුම කපු ඇට දිනා ගන්නා දක්ෂයෝ ද වෙති. බොහෝ නිවසක පෙත්ත වශයෙන් භාවිතා කරන්නට පරණ රාත්තල් බාගයේ නොහොත් කාලේ පඩියක් ඇත.

කාන්තාවන් විශේෂයෙන් සමත්කමක් පළ කරන ක්‍රීඩාවකි ගල් පෙළීම, අප මේවාට සහභාගි කර ගත්තත් වැඩිදුර යන්නට අපි අපොහොසත් වෙමු. අනුක්‍රමයෙන් සංකීර්ණ ස්වරූපයක් ගන්නා මෙහි දී අපට හැකි වනුයේ ගලක් උඩ දමා තව එකක් දෙකක් අහුලාගෙන වැටෙන්නට පෙර උඩ දැමූ ගල අල්ලා ගැනීමේ තැනට එන්නට පමණි. ගල් කිහිපයක් මිට මොලවා ගෙන එය කිරීමේදී බොහෝ විට අපි පරාද වන්නෙමු. වඩාත් ම සංකීර්ණ වූ වටුවා ගැසීම නම් අපට කොහෙත්ම බැරි තරම් ය. හැම පියවරක් ම නොවරදවා දිනන්නට අපේ අ‍ක්කලා සමත් වූහ. මට අක්කලා නැත. මහප්පාගෙ දියණියන් දෙදෙනා ද අනෙක් පැත්තේ වෙලෙන් එගොඩ පිහිටි තාත්තාගේ පුංචි අම්මාගේ ගෙදර සිටි අක්කලා දෙන්නා ද අප සෙල්ලමට සහභාගි කර ගත්හ. තාත්තාගේ පුංචි අම්මාගේ වැඩිමහල් පුතාගේ අනෙක් දරුවන් අතර වූ සුදු අයියා පසු ව මට වඩාත් ම සමීප වූයේ ය. ඔවුන්ගේ පියා මිය ගියේ මා ඉපදෙන්නට කලින් ය. කෙසේ හෝ සුදු අයියාගේ මිතුරුකම නිසා ඒ ගෙදර අවුරුදු කාලයට අපේ ගෙදර බඳු විය.

පංච දැමීම ද කාන්තාවන්ගේ ක්‍රීඩාවක් විය. මෙහි දී නම් එක්ත්‍රා වාසනා ගුණයක් තිබිය යුතු වී යයි මම සිතමි. පමා නොවී පංචියක් වැටුණු ක්‍රිඩකයාට ඉදිරියට යා හැකි ය. කවඩි පහ මූනත උඩට සිටින්නට වැටීමය පංචිය යනුවෙන් හැඳින්වූයේ, එසේ වැටුණු විටය ක්‍රීඩාව ඉදිරියට යන විට සහභාගි වීමට අවසර ලැබෙනුයේ-සල්ලම් වනුයේ, සමහර කාන්තාවන්ට මෙහිදීත් අත්ගුණයක් ඇද්දැයි මට සැක සිතුණේ අක්කලා බොහෝ විට පරදවන්නට සමත් වූ හෙයිනි. පුංචි පෙතේ ඉත්තන් තැබීම ද කල්පනාවෙන් කළයුතු කාරියක් වීම ඔවුන්ගේම වාසියට සිටියේ ය. ඔංචිල්ලා පැදීමත් ගැහැනුන්ගේ ම ක්‍රීඩාවකැයි කිව හැකි ය. කොල්ලෝ කුරුට්ටන් හැරෙන්නට එකල පිරිමි ඔංචිලි පදිනවා මා දැක නැත.පිරිමින්ට මුල්තැන ලැබෙන පිරිමින්ගේ හපන්කම් ඉස්මතු කරන ඔංචිල්ලාවක් ද ඉඳ හිට ගම්වල දක්නට ලැබිණ. ඒ කතුරු ඔංචිල්ලාව ය. කෙනකුට මැද හිටගෙන සිටීමට ඔහුගේ හිසට මඳක් වැඩි උසකින් මැදට යොදන ලද ශක්තිමත් කඳක් වටා කරකැවෙන අයුරු ලීයෙන් නිමවනු ලබන කතුරු ඔංචිල්ලාවක් බැඳීමට සමත් වැඩිහිටියන් සිටියේ කලාතුරකිනි. ඔංචිල්ලාව පද්දන්නේ මැද සිට ගත් පුද්ගලයා මැද කූඩුව තුළ ඇවිදින වේගය ඇනුව ය. එම ගමන හැඳින්වූයේ පොලු පෑගීම නමිනි. අපේ ගෙවල්වලට තරමක් දුරින් තැනක සාදන ලද කතුරු ඔංචිල්ලාවක් බලන්නට ගියා මට මතකය. බලන්නට ගියේ මා පමණි. මා සමඟ ගිය අනෙක් අය ඔංචිල්ලාව පැද්දෝ ය. වේගයෙන් පොලු පාගන විට දෑතින් උඩ ලීයක් අල්ලා ගෙන සිටින්නන් වටයක් කරකැවී යනවා දුටු මම එයට නගින්නට බියවීමි. බලා සිටියදීම සිදුවන්නට ගිය අනතුරක් මට මතක ය. පොලු පාගමින් සිටි තරුණයා වේගයෙන් පොලු පාගමින් සිට මැද කඳෙන් අනෙක් පැත්තට පනින්නට ගියේ ය. පිම්ම වැරදීමෙන් කූඩුව තුළ වැටුණු ඔහු දුටුවන් ඔංචිල්ලාවේ එල්ලී වහාම එය නවතා නො ගත්තා නම් ඔහුගේ තත්වය බරපතළ වන්නට තිබිණි.

කතුරු ඔංචිල්ලාවට නුදුරින් සූදු පිටියක් බිහිවීම ද අනිවාර්ය ලක්ෂණයක් විය. අවුරුදු සමයේ ජනප්‍රිය සූදුව කැට ගැසීම ය. හැම කඩපළකම කැට ගැහීමට රැ ස් වූ පිරිසක් දැක්ක හැකි ය. අන් කිසි දිනක සූදුවකට නොයන ගැහැනුන් පවා හෙමිහිට ඔට්ටුවක් අල්ලනවා දක්නට ලැබෙයි. කැටය අතට ගෙන ලෑල්ලට වීසි කරන පුද්ගලයාගේ වාසනාව ගැන විශ්වාස කරන්නෝ එම වේලාවට වැඩි වැඩියෙන් ඔට්ටු අල්ලති. සත ගණනක සිට ඉහළට ඔට්ටු ඇල්ලිය හැකි හෙයින් තමන්ගේ වත්කම ඇනුව සියල්ලන්ටම සූදුවට සහභාගි විය හැකිය. අවුරුදු සමයේ දින ගණනාවක් පැවැත්වෙන මෙම සූදුවට පොලිසිය බාධා කරන්නේ නැත.

සිංහල අවුරුද්දේ ද නොනගතය උදා වන තෙක් අප බලා සිටියේ නොඉවසිල්ලෙනි. සූර්යයා මීන රිශියෙන් මේෂ රාශියට ගමන් ගන්නා වේලාව වන මේ කාලය තුළ දී කිසිම වැඩකට අත ගැසීම හොඳ නැත. නොනගතතේට වැඩ වැඩි වන්නේ ගෘහිණියට ය. ලිපේ අළු ටික පවා එක්කාසු කොට ගෙන් බැහැරට දමන ලැබේ. එය පරණ අවුරුද්දේ වස් දොස් සියල්ලම පිටමං කිරීමේ සංකේතයකි. ආහාර පිසීමට නැකත එන තෙක් ම ලිපට නිවාඩු ය. එම නැකතට ලිප් බැඳ ගිනි මොලවා ආහාර පිසිය යුතු බවය. ලිතේ කියා ඇත්තේ, දල්වන්නේ පරණ ලිපම ය. නොනගතය දික් වූ තරමට ය අප කැමති, නොනගතයේ ගෙදර ආහාර පිසීමක් නැත. කල් තියා පිළියෙළ කරගත් කැවිලි පෙවිලිපමණි. ඒ නිසාය අප වඩාත්ම කැමති වූයේ, කැවුම් කොකිස් බඳු රස කැවිලි පෙවිලි වරදින ගෙදරක් ගමේ නැත. ඒ හැරෙන්නට මා ප්‍රිය කළ කැවිලි දෙජාතියක් විය. සව් දොදොල් සහ හැලප, සව් දොදොල් නමින් අප හැඳින්වූයේ වැලිතලපවලට සමාන වූවකි. එහෙත් අම්මා එය හදන විශේෂ ක්‍රමයක් විය. ඉතා සරල-සුලබ කෑමක් වූ හැලප කෙරෙහි එද මා තුළ පැවති රුචිය අදත් අඩු නැත. පිට ගෙදරකින් කෑමක් දෙන්නේ වත් කන්නට යන්නේවත් නැති කාලයක් වුව ද ඒ තහංචිය සුදු අයියලාගේ ගෙදරදී අපට නො තිබිණි.

නොනගතය දා උදෑසනින් ම අම්මා සමඟ පන්සල් යාමට අපි පුරුදු වූයෙමු. බොහෝ විට අතරමඟ දී අපි කට්ටි පනින්නෙමු. කොලු රංචුවට එක් වන අපි සෙල්ලමට වැටෙන්නෙමු. අවුරුදු කාලයේ නිසා එයට අවසර ඇත. චක්ගුඩු පැනීම සහ තාච්චි පැනීමේ දී දෙදෙනකු එකතුව විකට් නම් දෙකක් හිතාගෙන ගොස් දෙපිලේ මූලිකයන් ඉදිරියට ගොස් ඔවුන්ට දෙකෙන් එකක් තෝරා ගන්නට-ඉල්ලන්නට-කියා බලා සිටීම අපාට ලොකු විනෝදයක් විය. සීනි-ලුණු දෙක කලවම් නොවී පල්ලෙහාට ගොස් උඩට එන්නට හැකිවීම ද අපට විශාල ජයග්‍රහණයක් විය. එය එතරම් පයසු ද නොවී ය. කල්lි ගැසීම ද අප ඉඳහිට සහභාගි වූ ක්‍රීඩාවකි. අප වැනි කුඩා ළමයින්ට වැඩි කොට ම සිදු වූයේ කල්lි අදින්නට ය. අපේ අළුප්පේ වත්තේ මායිමට වන්නට කරච්හේනේ පොල් ඉඩමක පැවැත්වුණු බෝල ගැහීමකට අපි ඉඳ හිට සහභාගි වූයෙමු. එය ගැමි තරුණයන්ගේ ක්‍රිකට් ක්‍රීඩාවක් ලෙසින් හඳුන්වන්නට ද හැකිය. හරිහැටි පිල් බෙදීමක් නොතිබුණු එම ක්‍රීඩාවට නවීන පන්නයේ පිත්තක් හෝ විකට්ටුවක් නොවී ය. පිත්ත ලීයෙන් සාදා තිබුණ ද විකට්ටුව බොහෝ විට පොල් පිත්තක මුල් කොටසය. බෝලය ඔට්ට පාළුවලින් ඔතා සාදා ගනු ලැබූවකි. ඒ නිසාම බිව වැටුණු විට පහසුවෙන්ම උඩ යන්නකි.

මේ බෝල ක්‍රීඩාවේ විශේෂය වූයේ පන්දු යැවීම ය. නැමී අත පහත් කොට පොළවට අඟල් ගණනක් උඩින් බිම නොගැටෙන පරිදි පන්දුව යැවීම සෑහෙන දක්ෂතාවකින් කළ යුතු විය. එසේ වුව ද අප වැනි පුංචි ළමයින්ට මුහුණ දීමට අපහසු තරම් වේගයකින් පන්දු යවන්නට සමත් තරුණයෝ දෙතුන් දෙනෙක් වූහ. ක්‍රීඩාවට පවුල් වන තරුණයන් අතර හතළිහ පැනපු දෙතුන් දෙකනු ද සිටි බව මතක ය. ඔවුහු පරණ පුරුදුකාරයෝ ය. පුරුදුකාරයකු පිත්ත අතට ගත් විට ඉවත්තව යන්නේ සෑහෙන වේලාවක් ගොසින් ය. එබන්දකු දවා ගැනීම අපහසුය. අපට වැඩි කොට ම පන්දු අහුලන්නට සිදු වූ හෙයින් එහි ගියේ කලාතුරකිනි.

අවුරුද්දට අකුරට ම අන්ගමනය කරනු ලැබූ නැකත් වේලාව ළං වන විට මුළු ගම ම නිහඬය. රතිඤ්ඤා පත්තු කිරීමක් තබා කෑ කොස්සන් ගැසීමක් පවා ඇසෙන්නට නැත. ගෘහිණියන් පමණක් නොව හැම කෙනෙකු ම සවන් දීගෙන ඉන්නේ පන්සලේ ඝණ්ඨා නාදයට ය. ඔරලෝසුවක් ඇති ගෙවල උදවිය වුව ද ඝණ්ඨා නාදයට වැඩි සැලකිල්ලක් දැක්වූ හ. හරියට ම නැකත් වේලාවට ඒ හඬ ගම පුරා පැතිරෙයි. සමහර විට බෙත්තාරාමයේත් ද, කුඩා උඩුඅවේ බෝමළුවේත් ඝණ්ඨා නාදය තරඟයට මෙන් ඇසෙන්නට වෙයි. නොනගතය කාලය තුළ තේ වැක්කිරීම සඳහා මිදුලේ ඉදිකර තිබූ තාවකාලික ලිප අත්හැර දමන ගෘහිණිය පුරුදු ලිප දල්වා ආහාර පිසීම අරඹයි. අවුරුදු ආහාරයට කිරි බතක් තිබිය යුතුම ය. හත්මාළුවක් පිසීම ද කලක් සිරිතක්ව පැවතියේ ය. කෙසේ වුවද සාමාන්‍ය දවසකට වඩා විසිතුරු විවිධ ආහාරයක් හැම නිවසකට පිළියෙල කැරෙයි.

ආහාර අනුභවයට පිළියෙළ කරන අතරම ගෘහිණිය විසින් ඉටු කළ යුතු තවත් රාජකාරියක් ඇත. කොස් අත්තකින් කිනිත්තක් කපා එය කැත්තක් සහ උදැල්ලක් සමග මිදුලේ කොණක තැන්පත් කිරීම ඇයට බාර ය. වැඩ ඇල්ලීමේ නැකත එන තෙක් කැත්තක් උදැල්ලක් ඇල්ලීම පිරිමියකුට තහනම් ය. වැඩ අල්ලා ආහාර අනුභව කරන්නැයි ලිතේ කියා ඇතත් අප එසේ කළේ කෑමෙන් පසුව ය. තාත්තාගෙන් පසු අපි එකිනෙකා වයසට අනුව පිළිවෙලින් කැත්තෙන් කොස් අත්තට කොටා උදැල්ලෙන් පොළවට කෙටුවෙමු. ඒ සමඟම පොතක් කියවන්නට අම්මා අපට මතක් කර දෙයි. නොනගතේ අතට අසුවුණු හැම දෙයක් ම කියවුව ද අපි අම්මාගේ අණ පිළිපැද්දෙමු.

බත් බෙදා අම්මාගේ අතින් ම කටක් කවන තෙක් අපි නොකා බලා සිටිමු. සමහර දිනක තාත්තාගෙන් අපට කාසියක් ද ලැබෙයි. අපේ ගනු දෙනු කිරීම එතැනින් හමාර ය. එහෙත් අම්මාගේ ගනුදෙනුව පටන් ගන්නේ ඉන් පසුව ය. හා පුරා කියා ගෙදරින් කෑම කන්නට එන්නැයි කෙනෙකුට ආරාධනා කරන්නේ අම්මා ය. එම අමුත්තා සමඟ අම්මා තවත් ගනුදෙනුවක් කළා ය. වියදම් පොට්ටනියක්, අම්මාට ලැබෙන වියදම් පොට්ටනිය ළිඳට දැමූ බවය මට මතක ඇත්තේ, හාල් තුනපහ සමඟ කාසියක් ද එම පොට්ටනියේ ඇතුළත් ය.

හිස තෙල් ගානා නැකත ආහාර අනුභවයෙන් දින දෙක තුනකට පසුව උදා වන්නකි. අප කුඩා අවදියේ ගම්වල එය ද තදින් අනුග මනය කරන ලදි. එදින උදෑසනින් ම මට පැවරෙන රාජකාරියක් විය. පියසේන අයියාත් සමඟ පන්සලට ගොස් අවශ්‍ය ඖෂධ (කසාය) ගෙන ඒමට මා යන්නේ කුඩා භාජනයක් ද රැගෙන ය. පන්සලේ තම්බනු ලබන ලොකු කසාය හැළිය ගමේ සියලු දෙනාගේ ම ප්‍රයෝජනය සඳහා ය. ගොඩපර ගෙඩියක් කපා පීරිසියකට දමා සකස් කරගන්නා නානු සහ තවත් පීරිසියකට වතුර ද ළඟ තබාගෙන ය තාත්තා තෙල් ගෑමේ කාරියට අත ගසන්නේ, හිසට සහ පයට තබාගත යුතු කොළ වර්ග දෙකක් ලිතේ සඳහන් වේ. හිසට තබන කොළ වර්ගය පිරිසිදු පාන්කඩයකින් ඔතා බාල්කයේ ගසනු ලැබේ. බොහෝ විට අනෙක් අවුරුදුද එන තෙක් එය එහි රැඳෙයි. පයට තබන කොළ නම් විගසින් ඉවත් කෙරෙයි. නානු ගා හිස සේදීම සංකේතවත් කිරීමට ඉන් බිඳක් බැගින් ඇඟිල්ලෙන් ගෙන හිස ගැල්වීමය තාත්තා කරන්නේ, ඉක්බිති ගල්වනු ලබන පොල්තෙල් ගාමින් තාත්තා කීමට පුරුදුව සිටියේ කෙටි වැකියකි.

''සුබ අලුත් අවුරුද්දක් වේවා''

එහෙත් සමහර වැඩිහිටියන් කරන්නට පුරුදු ව සිටි පරම්පරාගත දිග ආශිර්වාදයක් විය.*කළු කපුටා සුදු වන තුරු*

*බෝඹු ඉදල ලියලන තුරු*

*එක සිය විස්සට දෙසිය විස්සක්*

*ආයු බෝ වේවා!"*

ගමේ ප්‍රභූවරයකු වෙත ගොස් හිස තෙල් ගල්වා ගැනීමට ද සමහර ගැමියෝ පුරුදුව සිටියහ. වෙද බාප්පාගේ නිවසට අසල්වාසී බොහෝ දෙනෙක් එදිනට රෙක් වූහ. හැම දෙනාම එන්නේ බුලත් අතක් සහ දුම් කොළයක් ද රැගෙනය. තෙල් ගාගත් පසු වැඩිහිටියන්ට බුලත් දුම්කොළ දී වැඳීම අනිවාර්ය චාර්ත්‍රයක් විය. එය එක් අතකින් ගත වු වසර තුළ තමාගෙන් වු වරදක් ඇතොත් සමාව අයැදිමක් වන අතර අනෙක් අතට තම වැඩිහිටියාගේ ආශිර්වාදය ඉල්ලා සිටීමක් ද විය. වසරක් දෙකක් අමනාපයෙන් සිටි මහප්පාට බුලත් දුම්කොළ දෙන්නට අප කිහිප දෙකනු ම මහන්සි වී තාත්තා එකඟ කරවා ගෙන යැවූ සැටි මට අමතක නොවන්නකි. අවුරුදු නිවාඩුවෙන් පසු පාසැල පටන් ගන්නා දිනයේ ලොකු මහත්තයාගේ මේසය මත ඇඟිල්ලක් ගහන්නට ඉඩක් නැත. හැම ළමයෙක් ම පාහේ ඔහුට බුලත් දුම්කොළ දී වඳියි. පන්තියේ ගුරුවරයාට නොහොත් ගුරුවරියට බුලත් දුම්කොළ දී වඳින්නේ ඉන් පසුව ය.

දිවංගත ඩී.බී.කුරුප්පු